**2023 (2024) සාමාන්‍ය පෙළ**
**උපකාරක සම්මන්ත්‍රණය**

| 33 | S | II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை
General Certificate of Education (Ord Level) Examination

ඉතිහාසය II
வரலாறு II
History II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## I කොටස

(01) (අ) (i) පහත දී ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.
දැදුරු ඔය, ගල් ඔය, ලංකා පටුන, පුත්තලම, පොළොන්නරුව, ගන්නොරුව, නාච්චිදූව වැව, ඇළහැර අමුණ, බූන්දල, ඉබ්බන්කටුව, රයිගම, නල්ලූර් (ලකුණු 12)

(ii) පහත දී ඇති ඓතිහාසික ස්ථාන සියල්ල ම සපයා ඇති ලෝක සිතියමේ ලකුණු කර නම් කරන්න.
ඕම්ස් සමුද්‍රසන්ධිය, ඇම්බොයිනා, ජෙරුසලම, පොන්ඩිචෙරි, කොරියානු අර්ධද්වීපය, වැනීසිය (ලකුණු 6)

පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

(ආ) (i) (A) ඉසිගිරිය අමාත්‍යවරයාට නකදිව ප්‍රාදේශීය පාලන කටයුතු පැවරූ රජු.
(B) පළමු ලෝක යුද්ධයේ දී ජර්මනිය විසින් ගිල්වා දැමූ සුප්‍රකට මගී ප්‍රවාහන නෞකාව.
(C) කාර්මික විප්ලව සමයේ දුම් බෝට්ටුව නිර්මාණය කළ ශිල්පියා
(D) ක්‍රිස්තුස් වහන්සේගේ අවසන් රාත්‍රී භෝජන සංග්‍රහය සිතුවම් නිර්මාණය කළ ශිල්පියා. (ලකුණු 4)

- Aහා B යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.



A

(ii) 1. මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?
2. මෙය පිහිටා ඇත්තේ කවර රටක ද?
3. මෙම ගොඩනැගිල්ල කවර ආයතනයක් යටතේ තිබේ ද?
4. මෙම ගොඩනැගිල්ල හා සම්බන්ධ ආයතනය බිහිවන්නේ සමස්ත ලෝකයට බලපෑමක් කළ කවර සිදුවීමක් නිසා ද? (ලකුණු 4)



B

(iii) 1. මෙම ඡායාරූපයෙන් දැක්වෙන පුද්ගලයා කවරෙක් ද ?
2. ඔහු දැරූ එක් තනතුරක් නම් කරන්න?
3. ඔහු දැරූ එම තනතුර හා සම්බන්ධ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය නම් කරන්න ?
4. ඉහත අංක 2 යටතේ ඔබ සඳහන් කළ තනතුර වෙනසකට බඳුන් වීමෙන් පසු ඒ වෙනුවට ඇති වූ නව තනතුර නම් කරන්න? (ලකුණු 4)

(02) (i) (a) ශිලාලිපි, මැටි පුවරු ලිපි, බිත්ති ලිපි වැනි මූලාශ්‍ර සියල්ල පොදුවේ හැඳින්වීමට යොදාගත හැකි නම කුමක් ද??

(b) ලංකා ඉතිහාසය හැදෑරීමේ දී වැදගත් වන තඹතහඩු ලිපියක් හා රන් තහඩු ලිපියක් නම් කරන්න. (ලකුණු 3)

(ii) ඉතිහාසය ගොඩනැගීම පිණිස සාහිත්‍ය මූලාශ්‍රයක් පරිශීලනයේ දී සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න. (ලකුණු 4)

(iii) ඉතිහාසය ගොඩනැගීමේ දී ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස යොදා ගන්නා අභිලේඛන අතරින් සෙල්ලිපි වලින් ලබාගතහැකි ප්‍රයෝජන සාධක දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 5)

(iv) චිත්‍ර, මූර්ති, කැටයම් ආදිය තුළින් මෙරට සංස්කෘතික ඉතිහාසය හෙළිකරගතහැකි ආකාරය පිළිබඳ සාධක තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(03) (i) ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ වියලි කලාපීය ලෙන් දෙකක් නම් කරන්න.
ප්‍රාග් ඓතිහාසික මානවයාගේ අභිචාරයන් පිළිබඳ තොරතුරු හෙළිවන තෙත් කලාපීය ලෙනක් නම් කරන්න. (ලකුණු 3)

(ii) පූර්ව ඓතිහාසික යුගයේ අවමංගල ක්‍රම දෙකක් හා ඒවා උදාහරණ ඇති ස්ථාන 2ක් නම් කරන්න. (ලකුණු 4)

(iii) මෙරට පූර්ව ඓතිහාසික මානවයාගේ තාක්ෂණික ජයග්‍රහණ දෙකක් පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 5)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යුහය හා ස්වරූපය පිළිබඳ සාධක තුනක් ඇසුරෙන් විස්තරයක් කරන්න. (ලකුණු 6)

(04) (i) (a) මහවැලි නදිය

(b) දැදුරු ඔය

(c) කිරිඳි ඔය යන ගංගා ආශ්‍රිතව බිහි වූ පාලන මධ්‍යස්ථාන එක බැගින් වරහන් තුළින් තෝරා ලියන්න.

(ii) (අනුරාධපුර,යාපහුව, දඹදෙණිය, මාගම, පොළොන්නරුව,) (ලකුණු 3)

(iii) පණ්ඩුකාභය රජතුමාගේ සමයේ දේශපාලනික වැදගත්කම පැහැදිලි වන කරුණු දෙකක් ලියන්න. (ලකුණු 4)

(iv) පැරණි ලංකාවේ යකඩ නිස්සාරණය කළ ආකාරය පිළිබඳ සාධක ද ඇසුරු කරගෙන විස්තර කරන්න. (ලකුණු 5)

(a) අතීත ලංකාවේ මහා වැව් ඉදිකිරීමෙන් බලාපොරොත්තු වූ අරමුණු දෙකක් ලියන්න (ලකුණු 2)

(b) වැවක ප්‍රධාන අංග අතරින් තෝරා ගත් අංග දෙකක් පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 4)

(05) (i) මාඝ පාලන සමයට සමගාමීව පැවති දේශීය උප පාලන මධ්‍යස්ථාන තුනක් නම් කරන්න. (ලකුණු 3)

(ii) පහත A සිට D දක්වා ඇති ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුරු වරහන් තුළින් තෝරා ලියන්න.

(a) බෙලිගල දළදා මැදුරක් කරවූ පාලකයා

(b) කුරුණෑගල රාජධානියේ පළමු පාලකයා

(c) ගම්පොළ රාජධානිය සමයේ යාපනය රාජ්‍යයේ බලය මර්දනයට බලකොටුවක් කළ ප්‍රභුවරයා

(d) 1762 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමුවීමට ආ ඉංග්‍රීසි දූතයා.
(දෙවන බුවනෙකබාහු රජු, හ්‍යුබොයිඩ්, සේනාලංකාධිකාර, තෙවන බුවනෙකබාහු රජු, නිශ්ශංක අලකේශ්වර, තෙවන විජයබාහු රජු, ජෝන් ෆයිබස්) (ලකුණු 4)

(iii) දෙවැනි නාගරීකරණ අවදියේ දී මෙරට ආර්ථිකයේ ඇති වූ වෙනස්කම් දෙකක් නිදසුන් සහිතව පැහැදලි කරන්න. (ලකුණු 5)

(iv) හයවන පරාක්‍රමබාහු රජු ශ්‍රේෂ්ඨ පාලකයෙකු වීමට තුඩු දුන් හේතු සාධක තුනක් දක්වා ඒවා සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 6)

(06) (i) (a) ලංකාවේ මුහුදුබඩ ලන්දේසි පාලනය ක්‍රියාත්මක වන විට මහනුවර රාජධානියේ සිටි පාලකයන් දෙදෙනෙක්

(b) ලංකාවේ මුහුදුබඩ ඉංග්‍රීසි පාලනය ක්‍රියාත්මක වන විට මහනුවර රාජධානියේ සිටි පාලකයෙක් නම් කරන්න. (ලකුණු 3)

(ii) මහනුවර පාලකයෙකු වශයෙන් සෙනරත් රජතුමා මුහුණ දුන් අභියෝග දෙකක් නම් කරන්න. (ලකුණු 4)

(iii) දෙවන රාජසිංහ රජතුමා මහනුවර ඉතිහාසයේ කැපී පෙනෙන පාලකයෙක් සේ සැලකීමට මුල් වූ හේතු දෙකක් දක්වා ඒවා සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 5)

(iv) මහනුවර රාජධානියේ පරිපාලනයේ ස්වභාවය පිළිබඳ කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 6)

(07) (i) පහත A, B හා C ප්‍රශ්න වලට අදාළ නිවැරදි පිළිතුරු ලියන්න.

(a) ඉංග්‍රීසීන් මෙරටට පැමිණෙණ විට උඩරටරට පාලකයා කවු ද ?

(b) 1818 විමුක්ති අරගලය මර්දනය කිරීමට ඉංග්‍රීසීන් විසින් එවූ සිංහල ප්‍රභූවරයා කවු ද?

(c) 1848 විමුක්ති අරගලයට දායක වූ ප්‍රධාන භික්ෂූන්වහන්සේ කවු ද? (ලකුණු 3)

(ii) උඩරට රාජධානිය අල්ලා ගැනීමට ඉංග්‍රීසීන්ට බලපෑ හේතු හතරක් සඳහන් කරන්න. (ලකුණු 4)

(iii) 1818 විමුක්ති අරගලයට හේතු වූ සාධක දෙකක් දක්වා ඒ පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 5)

(iv) සෝල්බරි ආණ්ඩුක්‍රමයේ විශේෂතා කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 6)

## II කොටස

(08) (i) පහත A, B හා C යටතේ ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු ලියන්න.

(a) පුනරුදය සමයේ ෆ්ලෝරන්ස් නගරයේ සිටි සුප්‍රකට ධනවත් පවුලක් නම් කරන්න?

(b) මධ්‍යකාලීන පල්ලියේ දූෂණ විවේචනය කළ එක් අයෙක් නම් කරන්න

(c) ලෝරාට සැහැලි කවි නමැති කෘතියේ කතුවරයා කවරෙක් ද? (ලකුණු 3)

(ii) පුනරුද සමයේ කලා ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් දෙකක් ලියන්න. (ලකුණු 4)

(iii) පුනරුදය සමග යුරෝපයේ දේශපාලනික වශයෙන් සිදු වූ වෙනස්කම් දෙකක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 5)

(iv) පුනරුදය ලංකාවට බලපෑ ආකාරය සැකෙවින් විස්තර කරන්න (ලකුණු 6)

(09) (i) කාර්මික විප්ලවය පළමුකොට ම ඇති වූ ක්ෂේත්‍ර තුන නම් කරන්න. (ලකුණු 3)

(ii) කාර්මික විප්ලවය බ්‍රිතාන්‍යයෙන් ආරම්භ වීමට තුඩු දුන් හේතු දෙකක් ලියන්න. (ලකුණු 4)

(iii) කාර්මික විප්ලවයේ දේශපාලන ප්‍රතිඵල දෙකක් දක්වා විස්තර කරන්න. (ලකුණු 5)

(iv) කාර්මික විප්ලවය සමාජයට හා පරිසරයට ඇති කළ බලපෑම කරුණු තුනක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 6)

**2023 (2024) සාමාන්‍ය පෙළ**
**උපකාරක සම්මන්ත්‍රණය**

| 33 | STE | I |
|---|---|---|


eduhelp

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை
General Certificate of Education (Ord Level) Examination

ඉතිහාසය II
வரலாறு II
History II

1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)

විභාග අංකය
சுட்டெண்
Index Number ....................................



1. (අ) (ii)
1. (அ) (ii)
1. (a) (ii)



N